# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,501 — 1965 සැප්තැම්බර් 9 වැනි බ්‍රහස්පතින්ද — 1965.9.9

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දන්වීම ... ... | 111 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දන්වීම ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දන්වීම ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දන්වීම ... ... | — | විවිධ දන්වීම ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත්කිරීම ... ... | — | | |


## පිස්කල් විකිණීම පිළිබඳ දන්වීම්

### වයඹ පළාත

**කුරුණෑගල දිස්ත්‍රික් නඩු ශාලාවේ දීය**

මහනුවර බෝවල පදිංචි ඒකනායක මුදියන්සේලාගේ උක්කු බණ්ඩා ඒකනායක .................................... පැමිණිලිකාරයා.

**එදිරිව**

නොම්මරය 482/ඇස්

දඹදෙණියේ බටපොත ඇල පදිංචි පී. පී. ආමෝරම් පිල්ලේ ........................................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස 7 දින අපරභාග 3 ට 1 වෙනි ඉඩමේ සිට, පිළිවෙලින් ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1\. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ මැදපත්තු නෑගෙනහිර කෝරලේ බටපොතඇල යන ගම තිබෙන අක්කර 4, රූඩ් 2, පර්. 12 ක් විශාල මිල්ලගහමුල වත්ත හා මිල්ලගහමුල හේන යන ඉඩමේ නෑගෙනහිර පැත්තේ බෙදා වෙන් කරන ලද කොටසට මායිම්—උතුරට: 390 දරණ මූලික සැලැස්මේ 25 ජේ, 25 අයි, සහ 17 ඒ දරණ කොටස්ද, නැගෙනහිරට සහ දකුණට 390 දරණ මූලික සැලැස්මේ ලොට් 37 ඒ දරණ කොටසද, බස්නාහිරට: මිල්ලගහමුල වත්ත හා මිල්ලගහමුලහේනේ ඉතුරු කොටස ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ කොහු මෝල, යන්ත්‍ර, බොයිලේරු, කොහු බෙර සහ ඊට අයිති සියලු දේත්ය. ලියා පදිංචි කළ අංකය සී 1043/220.

2\. ඉහත කී කෝරලේ එම ගම තිබෙන වී දෙපැලක වපසරිය ඇති මහ අගාර් කුඹුරට මායිම්—උතුරට: මුදලිහාමිට අයිති ඉඩම සහ කුඹුරද; නැගෙනහිරට: ලවරිස් අප්පුට අයිති ඉඩමද; දකුණට: උක්කුබණ්ඩාට අයිති මිල්ලගහමුල වත්ත සහ ඉඩමද; බස්නාහිරට: කිරිමැණිකාට අයිති ඉඩමද; යන මෙකී මායිම් තුළ පිහිටි කුඹුරෙන් නොබෙදූ 1/4 පංගුව සහ එහි තුළ තිබෙන සෑම දෙයිනුත් සමාන කොටසක්ය. ලියාපදිංචි කළ අංකය සී 1043/219.

ඇස්කිසියේ මුදල රු. 6,629 ක්ද, රු. 4,500 ට 1963.2.19 දින සිට 63.6.17 දින දක්වා සියයට 12 බැගින් පොලියද, ඊට පසු ගෙවා නිදහස් වන තුරු නීති පොලියද, පිස්කල් ගාස්තු ආදියද, නඩු වියදම රු. 487.80 ද අයකර ගැනීමටය.

ලයනල් අ. පොතුහැර,
ව. ප. පිස්කල් තැන වෙනුවට.

වර්ෂ 1965 ක්වූ අගෝස්තු මස 30 වෙනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේ දීය.

9-119

---

**සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**


ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

D 1—111——ආර් 61833—1,754 (65/8)